සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා මහ බැංකුවේ I වැනි පන්තියේ මාණ්ඩලික නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගය - 2002

## (02 ) ලිවීමේ හැකියාව

පැ එකයි මිනිත්තු තිහයි

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

1. පහත දක්වෙන මාතෘකා අතුරෙන් **එකක්** තෝරා ගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.
   - (අ) රාජ්‍ය ව්‍යවසායයන් පුද්ගලික කරණය කිරීමේ ප්‍රතිවිපාක
   - (ආ) සන්නිවේදන කාර්යය උදෙසා පරිගණක තාක්ෂණය යොද ගැනීම
   - (ඇ) ඊශ්‍රායෙල් - පලස්තීන අර්බුදය හා මැද පෙරදිග සාමය
   - (ඈ) ශ්‍රී ලංකාවේ විරැකියා ප්‍රශ්නය හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය
   - (ඉ) ගෝලීයකරණ ක්‍රියාවලිය උදෙසා තුන්වන ලෝකයේ රටවල දයකත්වය
   - (ඊ) ජනමාධ්‍ය නිදහස හා ප්‍රවෘත්ති වාරණය
   - (උ) ශ්‍රී ලංකාවේ ඒකීය රාජ්‍ය සංකල්පය හා බලය විමධ්‍යගත කිරීම
   - (ඌ) ශ්‍රී ලංකාවේ වර්තමාන බලශක්ති අර්බුදය සඳහා විසඳුම්
   - (එ) දේශපාලන මතවාද ආර්ථික සංවර්ධනයට හා සාමකාමී සහජීවනයට බාධාවක් නොවිය යුතු ය.
   - (ඒ) ශ්‍රී ලංකා රජයේ පාසල්වල ඉංග්‍රීසි භාෂා මාධ්‍යය හඳුන්වාදීම

2. පහත දක්වෙන පාඨ කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක්ද යොදන්න. සාරාංශයේ අග ඔබ යෙදූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තය විසින් ඉටු කරනු ලබන කාර්ය භාරය කිහිප අතකින් ම වැදගත් වූවකි. විදේශ විනිමය ඉපැයුම් සහ රැකියා උත්පාදනය සම්බන්ධයෙන් මේ කර්මාන්තයේ දයකත්වය ඒ අතරින් වඩාත් ම වැදගත් වේ.

ඇඟලුම් කර්මාන්තය සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ නිෂ්පාදන පිරිවැය අඩු රටවලට මාරු වෙමින් යන "පය බුරුලින්" තබා ගෙන සිටින කර්මාන්තයක් වශයෙනි. සංවර්ධනය වන රටවල් ශ්‍රම පිරිවැය අඩුවීම නිසා අඩු පිරිවැයකින් නිෂ්පාදිත ඇඟලුම් නිෂ්පාදන අපනයනය කිරීමට පටන් ගැනීම නිසාත්, කම්හල් පවත්වා ගෙන ගිය නිෂ්පාදකයන් ඇඟලුම් කර්මාන්ත ප්‍රතිස්ථාපනය කිරීම නිසාත්, යුරෝපයේ සහ එක්සත් ජනපදයේ ඇඟලුම් කම්හල් රාශියක් වසා දැමීමෙන් මෙය පැහැදිලි වේ. ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් යුරෝපීය සම්බන්ධතාවක් සහිත වෙළඳ ලකුණුවලින් ඇඟලුම් නිපදවන එබඳු කම්හල් කිහිපය ම දනට ශ්‍රී ලංකාවේ තිබීම ප්‍රකට කරුණකි.

ඇඟලුම් නිෂ්පාදනය ශ්‍රම සූක්ෂ්ම නිෂ්පාදන ක්‍රියාවලියක් වන අතර, එය රඳ පවතින්නේ දැඩි ප්‍රාග්ධන ආයෝජනයක් මත නොවේ. එමෙන් ම නිෂ්පාදන පහසුකම් ස්ථාපනය කිරීම සඳහා සහ පුහුණු කිරීම සඳහා දීර්ඝ පෙරටු කාලයක් අවශ්‍ය නොවේ. එමෙන් ම නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා එයට සූදනම් වීමට ද දීර්ඝ කාලයක් අවශ්‍ය නොවේ.

ඇඟලුම් කර්මාන්තයේ භාවිතා වන එක ම විශාල ම යෙදවුම රෙදි වන අතර, එය නිමි නිෂ්පාදිතයෙන් සියයට 60 - 70 ක් පමණ වේ. එසේ ම ඒවා තරඟකාරී මිලකට ලෝකය පුරා ම ලබා ගත හැකි ද වේ. එබැවින් වෙළඳපොළේ නිෂ්පාදන පිරිවැයේ තරඟකාරිත්වය ප්‍රධාන වශයෙන් ම රඳ පවත්නේ ශ්‍රම පිරිවැය සහ පොදු කාර්ය පිරිවැය මත ය. කර්මාන්තයේ පිහිටීමේ සාපේක්ෂ වාසිය ද තරඟකාරී ලෙස වෙළඳපොළට අවතීර්ණ වීමට ඉවහල් වන මූලික සාධකයකි. කෙසේ වුව ද, ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය සහ ජපානය වැනි සංවර්ධිත වෙළඳපොළවල අලෙවි වන නිමි භාණ්ඩවල ගුණාත්මක භාවය ඉතා වැදගත් සාධකයක් සේ සැලකිය යුතුව ඇත.

ශ්‍රම සාධකය අඩු කිරීම සඳහා නව තාක්ෂණය විශාල වශයෙන් යොද ගැනීමේ ඉඩකඩ ඇති රෙදිපිළි කර්මාන්තය හෝ වෙනත් කර්මාන්තයක් හෝ සමඟ සසඳන විට ඇඟලුම් කර්මාන්තය බෙහෙවින් ශ්‍රම සූක්ෂ්ම වන අතර, ඒ සඳහා අතින් කරන ශ්‍රමය බෙහෙවින් අවශ්‍ය වේ. ඇඟලුම් කර්මාන්තය අධි තාක්ෂණික ප්‍රාග්ධන සූක්ෂ්ම කර්මාන්තයක් වීමට ඇති ඉඩකඩ ඉතා අඩු වූවත්, දනටමත් කිසියම් දුරකට ශ්‍රම සූක්ෂ්ම රාමුව තුළ ස්වයංක්‍රියකරණය යොද ගෙන ඇත.

ශ්‍රම පිරිවැය අඩු වන තාක්, ලාභ උපයන ව්‍යාපාරයක් වශයෙන් කර්මාන්තය පවත්වා ගෙන යාමට ඕනෑම රටකට හැකි විය යුතුය. මේ කර්මාන්තය ශ්‍රී ලංකාවට වැදගත් වන්නේ ඒ නිසා ය.

[ දෙවැනි පිටුව බලන්න.

3. පහත දැක්වෙන චිත්‍රය දෙස හොඳින් බලන්න.



ඉහත දැක්වෙන චිත්‍රය පාදක කොට ගෙන වචන 150 ක් පමණ වන පරිදි මනඃකල්පිත කථාන්තරයක් ලියන්න.

***